KIDS GOD WORSHIP
www.kidworship.kr

# කායින් සහ ආබෙල්

– 3rd Story–



17Page


**පොතේ ගුරා** දෙවියන්වහන්සේ පළමුව මැවූ ආදම් සහ ඒවට දරුවන් දෙදෙනෙක් ලැබුණා. වැඩිමහල් දරුවගේ නම කායින්. බාල දරුවගේ නම ආබෙල්. පිරිමි දරුවන් දෙදෙනාම ක්‍රමයෙන් වැඩී වර්ධනය වූවා.

**කායින්** ආහ්... වෙහෙසක් නොබලා වැඩ කටයුතු කරනවා.
එහෙනම් අපිත් වැඩ කරමු.

**ආබෙල්** ආහ් හා හා... හොඳයි. කරමු. හී හී හී...

**පොතේ ගුරා** කායින් ගොවියෙක් වූවේය. ඔහු මහන්සි වී වැඩ කරමින් භූමියෙන් එළදාව මෙන්ම පලතුරු ද උපදවා ගත්තේ ය.
ඔහු බාල සහෝදර ආබෙල් බැටළු පාලකයෙක් වූයේය.
ආබෙල් බැටළුවන්ට ඉතාම හොඳ කෑම දුන් අතර බැටළුවන් කා දමන්නට එන වෘකයන්ගෙන් ද ඔවුන් ආරක්ෂා කළා.

.......................................................................................




18Page

**පොතේ ගුරා** එක දවසක දී බාල සහෝදර වූ ආබෙල් ඔහුගේ බැටළුවන්ගේ කුළුදුල් සතුන්ව ගෙන ආවේ ය. කාලයකට පසු ඔහුගේ වැඩිමහල් සහෝදර වූ කායින් ද තමාගේ භූමියේ එලයෙන් දෙවියන්වහන්සේ වෙතට පූජාව ගෙන ආවේය. එහෙත් දෙවියන්වහන්සේ ආබෙල් සහ ඔහුගේ පූජාව සැළකූසේක. එහෙත් කායින් හා ඔහුගේ පූජාව නොසැලකූසේක.
මේ හේතුවෙන් කායින් කෝප වී ආබෙල්ට වෛර කරන්නට වූවා.

**කායින්** දෙවියන්වහන්සේ ආබෙල්ගේ පූජාව පමණක් පිළිගත්තේ ඇයි ?
ආබෙල් සිටියේ නැත්නම්, දෙවියන්වහන්සේ මාව තමා සළකන්නේ.

**පොතේ ගුරා** කායින්ගේ හදවත දෙවියන්වහන්සේ සමඟ අමනාපයෙන් පිරී ගිය අතර ඔහුගේ බාල සහෝදරයා සමඟ ඊර්ෂ්‍යා වූයේය. එක්තරා දවසක දී ආබෙල් පෙනෙන්නට සිටියේ නැත.
දෙවියන්වහන්සේ ආබෙල් ගැන කායින්ගෙන් ඇසුවේ ය.

.......................................................................................



19Page

**දෙවියන්වහන්සේ** කායින්.... ආබෙල් කොහේ ද ?

**කායින්** දෙවියන්වහන්ස, මම ඒක දන්නේ කොහොම ද ?
මම මාගේ සහෝදරයාගේ රැකවලා ද ?
මම කාර්ය බහුල ගොවියෙක්. මට ධාන්‍ය නෙළා ගැනීමට තියෙනවා.

**දෙවියන්වහන්සේ** කායින් ඔබ මොකක්ද මේ කළේ ?

**පොතේ ගුරා** දෙවියන්වහන්සේ, කලින්ම හැමදේම දන්නේය.
කායින් බොරු කියා, දෙවියන්වහන්සේ රැවටීමට උත්සහ කළේය.
කායින්, ආබෙල් කොහේද කියා දැන සිටියේය.



20Page



21Page

කායින් ඒක ඉවරයි.ආබෙල් ඔයා නැතුව... ආහ්හ්හ්......

පොතේ ගුරා කායින්, ආබෙල්ට එදිරි වී ගල්වලින් ගැසුවේය.
ආබෙල් ලේ හලමින් මැරුණේය. දෙවියන්වහන්සේ මේ සියල්ල දැන
සිටියත්, කායින්ගෙන් මේ ගැන ඇසුවා.
නමුත් කායින් දෙවියන්වහන්සේව රැවටීමට උත්සහ කළේය.

.........................................................................................

දෙවියන්වහන්සේ නුඹේ සහෝදරයාගේ ලෙයේ ශබ්දය භූමියෙන් මට හඬගසයි. දැන් පටන්
නුඹ භූමියේ වැඩ කරන විට භූමිය එහි සාරවත්කම දෙන්නේ නැත.
නුඹ පොළොවේ පලායන්නෙක් ද, තැනින් තැන යන්නෙක් ද වන්නේ ය.

කායින් දෙවියන්වහන්ස, ඔබ මේ ලස්සන පොළොවෙන්, මේ භූමියෙන් මාව
පිටතට එළෙවූ නිසා, මාව දකින අය මාව මරන්නට හදයි.

පොතේ ගුරා දෙවියන්වහන්සේගෙන් ඈත්ව ගිය නිසා, මේ පොළොවෙන් කොහේ
ගියත් ඔහුව මරයි කියා මරණ බයක්, කායින්ට දැණුනා. නමුත් කායින්
පව් කරලා, සිටියත් දෙවියන්වහන්සේ ඔහුට අනුකම්පා කර ඔබව කිසි-
වෙත් මරන්නේ නැත කියා පැවසුවා. කායින් ස්වාමින්වහන්සේ ඉදිරියෙන්
පිටත්ව ගොස් ඒදනෙන් පෙරදිග නොද් දේශයේ වාසයේ කළේය.

.........................................................................................

ජිවිතයට අදාල කිරීම දුවේ පුතේ, ඔබේ සහෝදරයන්ට ආදරේ කරන්න.
කවදාවත් ඔවුන්ට නරකක් කරන්න හිතන්න එපා.
ඒක දෙවියන්වහන්සේ අකමැති කරන දෙයක්.